# වාරිමාර්ග අමාත්‍යාංශය
## நீர்ப்பாசன அமைச்சு
## Ministry of Irrigation

500, ටී.බී.ජයා මාවත,
කොළඹ 10

500, டீ.பீ. ஜாயா மாவத்தை,
கொழும்பு 10

500, T.B. Jayah Mawatha,
Colombo 10

2021.03.26

# - ප්‍රවෘත්ති නිවේදනය -

**<u>ශ්‍රී ලංකාවේ ගිනිකොණදිග වියලි කලාපයේ පානීය, වාරි, කර්මාන්ත හා සේවා ජල අවශ්‍යතා සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සකස්කර ඇති වාරිමාර්ග සැලැස්ම.</u>**

පසුගිය දින කිහිපයක සිට මාධ්‍ය ක්ෂේත්‍රය තුල ගිං නිල්වලා අතිරික්ත ජල හැරවුම් වාරි ජල යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම පිණිස, ලෝක උරුම සිංහරාජ වනාන්තර රක්ෂිතයෙන් හෙක්ටයාර 05 ක වපසරියක ගබඩා ජලාශයක් ඉදිකිරීම පිළිබඳව නිර්මාණය වී ඇති සංවාදය හා සබැදේ.

ගිං සහ නිල්වලා ගංගා හැරවුම් ව්‍යාපෘතිය, මධ්‍යම කඳුකර තෙත් කලාපයේ සිට ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක ඔස්සේ ඉන්දියන් සාගරය වෙත ගිං සහ නිල්වලා ගංගා ඔස්සේ ගලා බසින අතිරික්ත ජලය, යාබද ගිනිකොණදිග වියලි කලාපයට හැරවීම පසුගිය ශතවර්ෂයක පමණ සිට සංවාදයට භාජනයවූ යෝජනාවකි.

ගිං සහ නිල්වලා ගංගා මගින් ගලාබස්නා සමස්ථ ජල ධාරිතාවයෙන් 80% ක් පමණම කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන ඉන්දියන් සාගරයට යොමුවන බැවින්, යාබද මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක අයත් මෙරට ගිනිකොණදිග ශුෂ්ක වියලි කලාපයේ ජිවත්වන ලක්ෂ ගණනක් වූ ග්‍රාමීය ප්‍රජාව තම ජීවිත කාලය පුරාම මුහුණ දෙමින් සිටින, අතිශය උග්‍ර පානීය හා වාරි ජල අවශ්‍යතාව මෙන්ම එම දිස්ත්‍රික්ක වල ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය කර්මාන්ත හා සේවා අංශ වල ජල අවශ්‍යතා සපුරාලීම පිණිස, දීර්ඝ කාලයක් මුළුල්ලේ සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයන පදනම්ව මෙම ව්‍යාපෘති යෝජනාව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අරමුදල් සම්පාදනය පිණිස මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

මෙම අතිශය වැදගත් වාරි සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වාරිමාර්ග දෙපාර්තමේන්තු මුලාශ්‍රවලට විශ්ලේෂණය කිරීමේදී, එහි ආරම්භය පහත පරිදි පෙළගැස්විය හැක.

(අ) ගිනිකොණදිග වියලි කලාපය මුහුණ දෙන උග්‍ර ජල අර්බුදයට පිලියම් ලෙස ප්‍රථම සැලසුම එවකට පැවති බ්‍රිතාන්‍ය රජයට ඉදිරිපත් කර ඇත්තේ 1887 වර්ෂයේදී "නිල්වලා ගඟේ ශාඛාවක් හම්බන්තොටට හැරවීම" යන තේමාව යටතේය.

(ආ) දෙවනුව, වර්ෂ 1936 දී එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කල දිවංගත දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා විසින් නිල්වලා ගඟේ ඉහල ජලාශයක් ඉදිකර ගිනිකොණදිග ශ්‍රී ලංකාවේ බහු කාර්යය සංවර්ධනයක් සිදුකල හැකි බවට එවකට පැවති බ්‍රිතාන්‍ය රජයට යෝජනා කර ඇත.

(ඇ) බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබීමෙන් පසුව, ඉහත යෝජනාව පදනම් කොට වර්ෂ 1968 දී එවක පැවති රජය විසින් කළු, නිල්වලා සහ ගිං යන ගංගා ද්‍රෝණි ජලය ගිනිකොණදිග වියලි කලාපයට යොමු කිරීම පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම පිණිස වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඇමරිකානු විශේෂඥ ආයනතනයකට අනුමැතිය ලබාදී ඇත.

(ඈ) 1980 වර්ෂයේදී, ගිං ගඟ ආශ්‍රිතව වාර්ෂිකව අත්විඳින දැඩි ගංවතුර තර්ජනයට විසඳුමක් ලබාදීම උදෙසා ප්‍රංශ රජයේ ආධාර සහිතව නිල්වලා ගඟේ ගං වතුර පාලන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

ලේකම්
செயலாளர்
நகல்
Secretary
011 – 2676844
2689548

කාර්යාලය
அலுவலகம்
Office
011 – 2684710

ෆැක්ස්
தொலை
Fax
011 –

(ඉ) 2009 වර්ෂයේදී පරිසර සමතුලිතතාවට හානියක් නොවන අයුරින්, තිරසර සංවර්ධන නව ප්‍රවේශයකට අනුකූලව ගිං සහ නිල්වලා ගංගාවල අතිරික්ත ජලය මෙරට ගිනිකොණදිග වියලි කලාපයට අයත් දිස්ත්‍රික්කවල ජල අවශ්‍යතා සඳහා හැරවීම ඉලක්ක කරගෙන ශක්‍යතා අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත.

2009 වර්ෂයේ දී සැලසුම් කරන ලද යෝජිත ව්‍යාපෘතිය මගින් නිල්වලා ගංගා ද්‍රෝණියේ අම්පානාගල ප්‍රදේශය ආශ්‍රිතව **අම්පානාගල ජලාශයද**, ගිං ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව සිංහරාජ වනාන්තර සීමාවේ ජනාවාස ප්‍රදේශයක් වන මාදුගැට ගම ආශ්‍රිතව **මාදුගැට ජලාශයද**, කොටපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල **කොටපොල අමුණ** ස්ථාපනය කිරීමටද යෝජනා වී ඇත.

යෝජිත ගබඩා ජලාශ ත්‍රිත්වය අතුරින් මේ වන විට විවාදයට තුඩුදී ඇති ඇත්තේ යෝජිත **මාදුගැට ජලාශය** ඉදිකිරීමට ශක්‍යතා අධ්‍යනය මගින් නිර්දේශිත ස්ථානය ආශ්‍රිතවයි.

වර්ථමානයේදී සමාජ මාධ්‍ය තුල දැඩි සංවාදයට ලක්ව ඇති මෙම වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව පසුගිය වසර 11 ක කාල පරාසය තුල සිදුකර ඇති සාකච්ඡා, පර්යේෂණ, අධ්‍යයන, ගවේශණ යනාදිය, පහත අයුරින් පෙලගස්වනු රිසියෙමි.

**1988 - සිංහරාජ වනාන්තර ප්‍රදේශය ලෝක උරුමයක් බවට නම් කිරීම.**

2009 - මූලික ව්‍යාපෘති සැලසුම් සම්පාදනය.

2009 - මූලික ශක්‍යතා අධ්‍යන කටයුතු ආරම්භ කිරීම.

2017 - භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යනය සිදු කිරීම.

2017 - පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය ආරම්භ කිරීම.

2020 - ව්‍යාපෘතිය සඳහා යුනෙස්කෝ අනුමැතිය සඳහා පළමු ඉල්ලීම.

2020/12/30 - යුනෙස්කෝ ජාතික කොමිසම සමඟ පළමු සාකච්ඡාව.

2021/01/27 - යුනෙස්කෝ ජාතික කොමිසම සමඟ දෙවන සාකච්ඡාව.

2021/02/02 - යුනෙස්කෝ ජාතික සොමිසම මඟින් යුනෙස්කෝ ලෝක උරුම කමිටුව වෙත ව්‍යාපෘති යෝජනාව සලකා බැලීම පිණිස නිල ඉල්ලීම සිදු කිරීම.

ප්‍රංශයේ, පැරිස් නගරය කේන්ද්‍රකොට පිහිටා ඇති එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, සමාජීය හා සංස්කෘතික සංවිධානයේ (යුනෙස්කෝ) රෙගුලාසි ප්‍රකාරව, කිසියම් රටක ලෝක උරුම ලෙස නම් කර ඇති ස්ථාන ආශ්‍රිතව කිසියම් සුවිශේෂී ක්‍රියාකාරකම් සිදු කරන්නේනම් ඒ පිළිබඳව විශ්ලේෂණාත්මකව සලකා බලා අනුමැතීන් ලබාදීම සඳහා ස්ථාපනය කර ඇති **ලෝක උරුම කමිටුව** සාමාන්‍යයෙන් වසරකට හෝ දෙකකට එක් වරක් රැස්වන බැවින් ශ්‍රී ලංකා රජය විසින් කර ඇති ඉල්ලීම පිළිබඳව සලකා බැලීම මීළඟ කමිටු රැස්වීමේදී සිදු කරනු ඇත.

මවිසින් කරන ලද ඉහත විශ්ලේෂණයට අනුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙන්ම වාරිමාර්ග අමාත්‍යාංශයද මෙම ව්‍යාපෘති යෝජනාව පිළිබඳව ඉතා වගකීමෙන් යුතුව සියලුම පාරිසරික, තාක්ෂණික, භූගෝලීයමය වශයෙන් නිසි විශ්ලේෂණ සිදු කරමින් ලබාගතයුතු සියලුම පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර එකඟතාවලට අනුකූලව අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව පැහැදිලිවනු ඇත.

**අනුර දිසානායක**
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය